# ප්‍රභාකරන්, රනිල්, චන්ද්‍රිකා ත්‍රිත්වය

කොටි මාවිල් ආරු සොරොව්ව වසා දැම්මේ හුදෙක් ජනතාවට වතුර නැති කිරීමේ පරමාර්ථයෙන් පමණක් නොවන බව දැන් හෙළිදරවු වෙමින් පවතී. ඔවුන්ට අවශ්‍ය වූයේ තිරිකුණාමල වරායද අවට ප්‍රදේශ තමන් අතට පත්කරගෙන ඒ ප්‍රදේශවලින් සිංහල හා මුස්ලිම් ජනතාව එළවා දැමීමය. මාවිල් ආරු වසාදමා දින කිහිපයකට පසු මුතූර් ප්‍රදේශයට පහරදුන්නේ ඉහත කී අනෙක් කරුණු ද ඉටුකරගැනීමටය. ඒ බව සොල්හයිම් හා අනෙක් නෝර්වේ ජාතිකයන් මෙන්ම බ්‍රිතානීහුද, අනෙක් බටහිරයෝ ද දැන සිටියහ. ඉන් අදහස් කරන්නේ ඒ රටවල දේශපාලනඥයන් හා නිලධාරීන් කිහිපදෙනකු පමණක් බව සඳහන් කිරීමට සිදුවන්නේ බොරු පණ්ඩිතයකු රටවල සියලු ජනතාව ඒ බව දැනසිටියේ දැයි ඇසීමට ඉඩ ඇති බැවිනි.

මේ සිද්ධි දැනසිටි අය අතර ඉන්දීය නායකයන් ද රනිල් වික්‍රමසිංහ ද සිටි බව පෙනෙන්නට ඇත. ඉන්දියාව වෙනදාටත් වඩා වුවමනාවෙන් මෙරට ප්‍රශ්නයට දැන් මැදිහත් වෙයි. ඒ දෙමළ ජාතිවාදී ප්‍රශ්නයට විසඳුමක් සෙවීමට නොව ප්‍රශ්නය තවත් අවුල්කිරීමටය. අද ඉන්දියාව සාර්ක් කලාපයේ හා අග්නිදිග ආසියාවේ බටහිරයන්ගේ නියෝජිතයා වෙයි. ඉන්දියාවෙන් තවදුරටත් යම්කිසිවකු දේශපාලන රැකවරණයක් බලාපොරොත්තුවන්නේ නම් ඒ එක්කෝ නොදැනුම්කමටය, නැතහොත් කපටිකමටය. තවදුරටත් ඉන්දියාව විශ්වාස කිරීම හා ඔවුන් අනුව කටයුතු කිරීම මහත් අනුවණකමකි.

කෙසේ වෙතත් ආණ්ඩුව වෙනදා මෙන් නොව මෙවර ඉන්දියාවට හා බටහිරයන්ට යටත් නොවීමට තීරණය කෙළේය. මෙහිදී කිවයුතු කරුණක් වෙයි. පාඩුවට පවත්වාගෙන යන සතිඅන්ත කසිකබල් පත්තර කඩමාල්ලක් කොටි සංවිධානයට ද එහා ගොස් කොටි ආරක්‍ෂා කිරීමට උත්සාහ කෙළේය. ඔවුන් කීමට තැත් කළේ ආණ්ඩුවේ වරදක් නිසා කොටි මාවිල්ආරු සොරොව්ව වසා දැමූ බවය. පත්තර කඩමාල්ලෙහි නිර්මාණයක් පමණක් විය. අඩුම තරමින් කොටි සංවිධානය පවා එවැන්නක් නොකීවේය. කොටි සොරොව්ව වසාදැමීමෙන් පසුව ආණ්ඩුව දින පහක් පමණ ගතවනතුරු සාම ලේකම් කාර්යාලය මගින් කොටි සමග සාකච්ඡා කිරීමට උත්සාහ කළ බව අද රෝහිණී නදිය ආශ්‍රයෙන් ආණ්ඩුවට බණ කියන රනිල්ලා හා ජෙහාන් පෙරේරාලා ජනතාවට සඟවති. බුදු බණ මතක් කරන මේ වැඩි දෙනා බෞද්ධයන් නොවන බවත් බුදුදහම ඔවුන්ට අනුව වුවද කෙතරම් යහපත් වුවත් ඔවුන් කිසිදිනෙක තමන් බටහිරයන්ගෙන් ලත් ආගම් පමණක් නොව සංස්කෘතියත් අත්නොහරින බවත් පැහැදිළිය.

මාවිල්ආරු සොරොව්ව විවෘත කිරීම සඳහා සාකච්ඡාවකට මුලදී කොටි සංවිධානය කැමති නොවීය. එහිදී සොල්හයිම්ලා නිරූපමා රාවෝලා නිහඬ වූහ. ජනතාවට වතුරදීම සඳහා හමුදාව මෙහෙයවීම හැරෙන්නට වෙනත් විකල්පයක් ආණ්ඩුවට නැති විය. හමුදා මෙහෙයුම් පටන් ගන්නා තෙක් බලා සිටි කොටි මුත්තූර් ප්‍රදේශය ආක්‍රමණය කළහ. හමුදාව මාවිල් ආරු විවෘතකර ගැනීමට ක්‍රියාකරන අතරම කොටින්ට ප්‍රතිප්‍රහාර එල්ල කෙළේය. ඒ සියල්ල අද වන විට ඉතිහාසයට එක්වී අවසන්ය. මාවිල් ආරු සොරොව්ව විවෘත කෙරී ඇති අතර, මුත්තූර් ප්‍රදේශයෙහි කොටි පරාජය කෙරී ඇත. මෙහිදී වැදගත්වන්නේ බටහිරයන්, ඉන්දියාව හා රනිල් වික්‍රමසිංහ ඒ සටනේ අවසන් කාලයෙහි ආණ්ඩුවට විරුද්ධව වාචිකව සටන් කළ ආකාරයය. කොටි සටනින් පරාජයවන බව දත් ඔව්හු ඊනියා සාකච්ඡා ආරම්භ කරන ලෙස ආණ්ඩුවට බලකර සිටියහ. ඊනියා සටන් විරාම නිරීක්‍ෂකයන් පොළොන්නරුවේ හා වෙනත් ප්‍රදේශවල වාසය කරන රෝහිණීලා ගැන මිස රෝහිණී නදිය ගැන නොදන්නවා විය හැකිය. එහෙත් මෙරට සිටින ඇතැම් අබෞද්ධයන්ට රෝහිණී නදිය මතක් විය. එපමණක් නොව ඔවුන් සියලු දෙනාට හා කොටින්ට මනුෂ්‍යත්වය ද මතක් විය. මනුෂ්‍යත්වයේ නාමයෙන් මාවිල්ආරු සොරොව්ව විවෘතකර ඊනියා සටන් විරාම ගිවිසුම අත්සන් කරන අවස්ථාවෙහි කොටි හා හමුදාව සිටි තැන්වලට ඔවුන් ආපසු යැවීමට සොල්හයිම්ට අවශ්‍ය විය. කොටි සොරොව්ව වසනවිට මනුෂ්‍යත්වයට කුමක්වී දැයි රනිල් නොදැන සිටින්නට ඇත. මේ සියල්ලන්ට අවශ්‍ය වූයේ කොටි පරදින බව දැනගත් පසු ඊනියා සාකච්ඡා මගින් කොටි රැකගැනීමය.

තමන් පරදින බව දත් කොටි සංවිධානයද පසුව මනුෂ්‍යත්වයේ නාමයෙන් මාවිල්ආරු සොරොව්ව විවෘත කරන බව කීවේය. එහෙත් ඒ සඳහා ඔවුහු යම් කොන්දේසි ඉදිරිපත් කළහ. ඒ කොන්දේසි අතර හමුදාව මාවිල් ආරු සිට කල්ලාර කඳවුර දක්වා පසුබැසීම හා කොටි කඳවුරු වෙත කෙරෙන ගුවන් ප්‍රහාර නතරකිරීමද විය. එලෙස

© Prof. Nalin De Silva

නොකරන්නේ නම් ඒ ආණ්ඩුව විසින් කෙරෙන යුද්ධ ප්‍රකාශ කිරීමක් ලෙස සැලකීමට සිදුවන බවද තමිල් සෙල්වන් නම් ත්‍රස්තවාදියා ටැමිල්නෙට් වෙබ් අඩවිය ඔස්සේ ප්‍රකාශ කළේය. ආණ්ඩුව කළ යුතු පරිදිම ඒ කිසිවකටත් සවන් නොදුන්නේය. සොල්හයිම් ඉන් කලබලයට පත්වී ආණ්ඩුවට මාවිල්ආරු සොරොව්ව විවෘත කිරීම හැරෙන්නට වෙනත් න්‍යාය පත්‍රයක් ඇති බවද සඳහන් කළේය. නෝර්වේ සාම තානාපති ලෙස හැඳින්වෙන හැන්සන් බෝයර්ට තමිල්සෙල්වන්ගේ ප්‍රකාශකයා වීම හැරෙන්නට වෙනත් කාර්යයක් නොවීය. ඔහු වරක් ප්‍රකාශකර සිටියේ මාවිල්ආරු සොරොව්ව විවෘත කිරීමට හිලවු ලෙස කොටින්ට නැගෙනහිර පළාතෙන් වරායක් ලබාදීමට ආණ්ඩුව එකඟ වී ඇති බවය. මෙය අතේ පැළවෙන කෙප්පයක් පමණක් නොව ත්‍රිකුණාමලය වරාය අල්ලා ගැනීමට කොටින්ට වූ අභිප්‍රාය හෙළිදරවු කරන්නක් ද විය. ආණ්ඩුව කියා සිටියේ කොටින්ට වරායක්දීම ඔවුන්ගේ දවල් සිහිනයක් පමණක් බවය.

මෙරට කතෝලික නොවන ක්‍රිස්තියානි සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන ඊනියා සාම මණ්ඩලයේ ජෙහාන් පෙරේරාට හා අනෙක් අයට රෝහිණී නදිය මතක් වූයේ මේ අවස්ථාවේදීය. මේ අතර සටනේදී මියගියවුන් අතර විදේශිකයන් ද රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන්ද සිටි බව අනාවරණය විය. මොවුන් සටනින් මියගිය අහිංසකයන් වීමට ඇති ඉඩකඩ ඉතා අඩුය. පොදුවේ ගත්කල රාජ්‍ය නොවන සංවිධාන යනු ආසියාවේ, අප්‍රිකාවේ හා දකුණු ඇමරිකාවේ රටවල ජනමතය සකස්කිරීම සඳහා බටහිරයන් විසින් පවත්වාගෙන යනු ලබන සංවිධාන වෙයි. බටහිරයෝ එක් පැත්තකින් ඒ ඒ රටවල ආණ්ඩුවලට සෘජුවම බලපෑම් කරන අතර, තවත් පැත්තකින් ඊනියා මහජන මතය ලෙස ආණ්ඩුවලට විකල්ප මතවාද සකස්කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන යොදා ගනිති. ඒ ඇතැම් සංවිධානවලට මහජන ප්‍රසාදය ඇතිකිරීම සඳහා ඒ සංවිධාන ඔස්සේ ජනතාවට ආර්ථික උපකාර ද කරති. සටනේදී මියගිය විදේශිකයන් හා රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන් පිළිබඳ සොයාබැලීම ආණ්ඩුවේ වගකීම වෙයි. රාජ්‍ය නොවන සංවිධානවල නැත්තේම ඔවුන් ආණ්ඩුවේ තිබිය යුතුම යැයි පවසන ඊනියා පාරදෘශ්‍යභාවයය. ආණ්ඩුවට හෝ ජනතාවට හෝ වගනොකියන රාජ්‍ය නොවන සංවිධාන වගකියන්නේ ඔවුන්ට මුදල් ලබාදෙන බටහිරයන්ට පමණක් බව අප තේරුම්ගත යුතුය. බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදයේ නියෝජිතයන් වූ රාජ්‍ය නොවන සංවිධාන රිසිසේ ක්‍රියාකිරීමට ඉඩ දී තිබීම මෙරට ස්වෛරීභාවයට බලවත් තර්ජනයකි.

සටන් පවතින අවස්ථාවේදී බටහිරයෝ මෙරට සිටින තමන්ගේ තවත් ඒජන්තයකු වූ රාවුෆ් හකීම් යොදාගැනීමටද අමතක නොකළහ. කොටි මුස්ලිම් ජනයා මූත්තූර් ප්‍රදේශයෙන් පලවා හැරීමට කටයුතු කරද්දී හකීම් කොළඹ සිට ප්‍රකාශ නිකුත් කරමින් ආණ්ඩුවේ ප්‍රහාර හේතුකොටගෙන මුස්ලිම් ජනයා මිය යන බව කියා සිටියේය. ඔහුගේ ප්‍රකාශවලට එයට සුදුසු පරිදි පරිභවයෙන් සැලකීම හැරෙන්නට වෙනත් දෙයක් කිරීමට ආණ්ඩුවට අවශ්‍යතාවක් නොවීය. රනිල්, හකීම් වැනි දේශපාලකයන්ට උදවුදීම සඳහා චන්ද්‍රිකා කුමාරතුංග නැවතත් කැඳවාගැනීමේ අවශ්‍යතාව අද බටහිරයන්ට ඇතිවී තිබේ. ඊනියා සාම ක්‍රියාවලිය නිසලෙස ක්‍රියාත්මක නොවන්නේය යන්න අද බටහිරයන්ගේ අදහස වී ඇත. ඔවුන් ඉන් අදහස් කරන්නේ ඔවුන්ට අවශ්‍ය ආකාරයට ඊනියා සාමය ඇතිකිරීමට, එනම් සංඝීයරාජ්‍යයක් ඔස්සේ ඊළමක් ඇතිකිරීමට, අද බාධා ඇති බවය. චන්ද්‍රිකා මෙරටට ආනයනය කර රනිල් චන්ද්‍රිකා සංධානයක් ගොඩනැගීමේ අවශ්‍යතාව බටහිරයන්ට ඇති අතර එමගින් මහින්ද චින්තන වැඩපිළිවෙළ අසාර්ථක කිරීම ඔවුන්ගේ අභිප්‍රාය වෙයි.

ප්‍රභාකරන්, රනිල්, චන්ද්‍රිකා ත්‍රිත්වය පරාජය කිරීමේ දැඩි වුවමනාව අද රට හමුවේ වෙයි. මෙරට මෙතරම් කාලකන්නි භාවයකට පත්වී ඇත්තේ බටහිරයන්ගේ අවශ්‍යතාවට ක්‍රියාත්මක වන මේ ත්‍රිත්වය හේතුකොට ගෙනය. එජාපකෂයේ සේනානායකලාගේ නායකත්වයෙන් තිබු ජාතිකත්වය අද එහි නැත. ඊනියා සටන් විරාම ගිවිසුමක් මගින් මෙතරම් අගාධයකට රට හෙළුවේ රනිල් චන්ද්‍රිකා යුවළය. එහිදී ප්‍රභාකරන් ඔවුන් සමග අතිනත ගෙන සිටියි. දෙන්නා දෙපැත්තෙන් සාංචි මැද්දෙන් කීවාක් මෙන් ප්‍රභාකරන්, රනිල් හා චන්ද්‍රිකා මැද දෙදෙනා සමග අත්වැල් බැඳගෙන සිටියි. රාජ්‍ය නොවන සංවිධානවල නිවටයෝ හා කසිකබල් මාධ්‍යවේදීහු ත්‍රිත්වය ඉදිරිපිට සොල්හයිම්ගේ පියානෝ වාදනයට ස්තෝත්‍ර ගයති. එහි අනුග්‍රහය ඉන්දියාවේ ද සහාය ලබන බටහිරයන් ගෙනි. මාවිල්ආරු සහ මූත්තූර් අපට හඬ ගා කියන්නේ මෙරට ජාතික බලවේගවලට මේ නරිනාටකය පරාජය කළ හැකි බවය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva